2717

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	10	විෂයය / பாடம் / Subject	ඉස්ලාම් - Islam	පත්‍රය / வினாத்தாள் / Paper	I	පැය / மணித்தியாலம் / Hours	1

- **සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1) මුහම්මද් නබි (සල්) තුමාණන් මදීනාවට යෑමට පෙර එම නගරය කෙසේ හැඳින්වූයේ ද?
(i) යත්රිබ් (ii) මක්කා (iii) කුෆා (iv) බසරා

(2) උම්මහාතුල් මූමින්වරියන්ගේ දැල්වියා ජීවත් වූ කාන්තාව කවුද?
(i) හන්සා (රළි) තුමිය (ii) ජුවෙරියා (රළි) තුමිය
(iii) අයිශා (රළි) තුමිය (iv) සෙයිනබ් බින්ත් ජහස් (රළි) තුමිය

(3) අරාබිකරයේ ඉස්ලාම් ව්‍යාප්තියට පෙර ගෝත්‍ර නායකයින් කෙසේ හැඳින්වූයේ ද?
(i) විද්වතා (ii) ආලිම් (iii) ශෛකු (iv) ලේබම්

(4) මුහම්මද් නබි (සල්) තුමාණන් රහ්මතන්ලිල්ආලමීන් වශයෙන් සිටියි. රහ්මතන්ලිල්ආලමීන් යන්නෙහි අර්ථය වනුයේ,
(i) සර්ව බලධාරියා (ii) සර්ව දූතයා
(iii) මුස්ලිම්වරුන්ගේ නායකයා (iv) මනුෂ්‍යයන්ගේ නායකයා

(5) මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ අනුගාමිකයන් සහ මක්කා කුරෙෂීවාසීන් අතර සිදු වූ "හුදෛබියා ගිවිසුම" නම් සාම ගිවිසුම සිදු වූ හිජ්රි වර්ෂය,
(i) හි. ව. 4 (ii) හි. ව. 5 (iii) හි. ව. 6 (iv) හි. ව. 7

(6) සීරා නම් ග්‍රන්ථය මුලින්ම ලියූ ලේඛකයා කවුද?
(i) මුහම්මද් ඉබ්නු ඉස්හාක් (ii) ඉබ්නු හිෂාම්
(iii) ඉබ්නු මුහම්මද් (iv) අබු අහ්මද්

(7) දැව සහ ඇණ භාවිතා කර නැවක් තැනූ නබිවරයා කවුද?
(i) හාරූන් (අලෛ) හිස්සලාම් (ii) නූහ් (අලෛ) හිස්සලාම්
(iii) යුසූෆ් (අලෛ) හිස්සලාම් (iv) යහ්යා (අලෛ) හිස්සලාම්

(8) එක් වරක් නබි (සල්) තුමාගෙන් උසස්ම රැකියාව කුමක්දැයි විමසූ විට නබි (සල්) තුමා දුන් පිළිතුර කුමක් ද?
(i) කර්මාන්ත සහ බොරු සහ වංචාව මිශ්‍ර නොවූ වෙළඳාම
(ii) වෙළඳාම සහ කෘෂිකර්මාන්තය
(iii) වෙළඳාම සහ කර්මාන්ත
(iv) කර්මාන්ත සහ කෘෂිකර්මාන්තය

(9) කණ්ඩායම් තුනක් නිරය නොදකින බව නබි (සල්) තුමාණන් පවසා ඇත. මෙහි ඇතුළත් නොවන කණ්ඩය වනුයේ,
(i) අල්ලාහ් වෙනුවෙන් නිදිමැරූ ඇස්
(ii) අල්ලාහ් ගැන බියවී හැඬූ ඇස්
(iii) අල්ලාහ් වැලක් වූ දෙයින් තමන්ගේ බැල්ම පාලනය කළ ඇස්
(iv) දහවල් සහ රාත්‍රී කාලයේ පොත් කිය වූ ඇස්

(10) ඉජ්මා හි වර්ග අතුරෙන් නිශ්ශබ්ද ඉජ්මාව වනුයේ,
(i) ඉජ්මා කොලී (ii) ඉජ්මා සුකූති
(iii) ඉජ්මා ශරීහ් (iv) ඉජ්මා අක්සරීය්‍යා

(11) පහත සඳහන් පුද්ගලයන්ගෙන් පිරිමියෙකුට විවාහ වීමට අනුමැතිය ඇති අජ්නබි වූ කාන්තාව,
(i) මවගේ සොයුරිය (ii) සහෝදරියගේ දියණිය
(iii) පියාගේ සොයුරියගේ දියණිය (iv) කිරි උරා බීමේ නෑකමෙන් සහෝදරිය

(12) තම තරුණ වියේ දී අරාබි ව්‍යාකරණ පිළිබඳව ලොව ජයගත් විද්වතා කවුද?
(i) ඉමාම් බුහාරි (ii) ඉමාම් ෂාෆි (iii) ඉමාම් අහ්මද් (iv) ඉමාම් ෂිබාවෙහි

(13) "දුර්වල වූ මුඃමීන්ට වඩා ශක්තිවත් වූ මුඃමීන්වරයා අල්ලාහ්ට වඩාත් ප්‍රියමනාප පුද්ගලයා වේ." යන්න
(i) නබි තුමාගේ වදනකි (ii) අල් කුර්ආන් වාක්‍යයකි
(iii) සහාභාවරුන්ගේ කියමනකි (iv) ඉමාම් වරුන්ගේ කියමනකි

(14) බොහෝ දෙනෙක් නොසලකා හරින දායාද 2 ක් පිළිබඳ නබි (සල්) තුමා අවවාද කර ඇත. එම දායාද දෙක
(i) විවේකය සහ ආහාර (ii) විවේකය සහ පිරිසිදුකම
(iii) නිරෝගීබව සහ විවේකය (iv) නිරෝගීබව සහ පිරිසිදුකම

(15) "හොඳින් අනුභව කරන්න, පානය කරන්න, නාස්ති නොකරන්න" යන්න
(i) හදීසයකි (ii) අල් කුර්ආන් වාක්‍යයකි
(iii) ඉජ්මා මඟින් ගනු ලබන තීන්දුවකි (iv) කියාස් මඟින් ගනු ලබන තීන්දුවකි

(16) ෆික්හුල් අව්ලවියාත් පිළිබඳ දැනුවත් වූ ඔබ පහත සඳහන් ඒවායින් ප්‍රමුඛත්වය දිය යුතු පළමුවැන්න
(i) නිවසේ වැඩ කටයුතුවලදී මවට උදව් කිරීම.
(ii) පාඩම් කටයුතු පුනරීක්ෂණය කිරීම.
(iii) අල් කුර්ආනය කටපාඩම් කිරීම
(iv) විපතකට භාජනය වූ පුද්ගලයකු ව රෝහලට රැගෙන යාම.

(17) පරායනා කර පෙන් වූ වහී ඇතුළත් පිළිතුර වනුයේ
(i) සුන්නාහ්ව (ii) හදීස් (iii) ඉබ්‍රාහීම් (නබි) තුමාගේ සිහිනය (iv) කුර්ආන්

(18) "දාරුල් බකා යනුවෙන් හැඳින්වෙන පදය වනුයේ"
(i) ලෞකික ජීවිතය (ii) පරලොව ජීවිතය
(iii) අල්පේච්ච ජීවිතය (iv) ප්‍රීතිමත් ජීවිතය

(19) අල් කුර්ආනය පියවර වශයෙන් පහළ වූ විට එය ලේඛනගත කළ ලේඛකයන් හැඳින්වෙන නම වනුයේ
(i) කුත්තාබුල් වහී (ii) වහී මත්ලුව් (iii) මුහද්දීස්වරු (iv) මුෆස්සීරූන්වරු

(20) මුහම්මද් නබි (සල්) තුමා පුද්ගලයකුගේ දෑත දීර්ඝවේලාවක් අල්ලාගෙන කතා කරමින් සිටි අවස්ථාවේ දී එතුමා දුන් පිළිතුර වනුයේ,
(i) ඔහු සෑම විටම තස්බීහ් කරමින් සිටි බැවින්
(ii) ඔහු නිහඬව සිටි බැවින්
(iii) ඔහු මහන්සි වී උපයා ජීවත් වූ බැවින්
(iv) ඔහු පහත් හඬින් කථා කරන නිසා

(21) සොරසතුරන් ඉදිරියේ සත්‍ය පැවසීමෙන් ඔවුන් යහපත් පුද්ගලයින් බවට වෙනස් වීමට හේතු වූ ශ්‍රේෂ්ඨ පුද්ගලයා
(i) ඉමාම් හසනුල් බසරි (රහ්) (ii) ෆුලෛයිල් ඉබ්නු රියාල් (රහ්)
(iii) උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්) (iv) අබ්දුල් කාදර් ජෛලානී (රහ්)

(22) මුහම්මද් නබි (සල්) තුමාගේ වෆාතයට පෙර රමළාන් මාසයේ දී ජිබ්රීල් (අලෛ) තුමා, නබි (සල්) තුමාගෙන්, අල් කුර්ආනය නිවැරදිදැයි පරීක්ෂා කරන ලදී. එම අවස්ථාවේ සිටි සහාබිවරයා වනුයේ කවුද?
(i) හුදෛබා (රළි) (ii) සෛයිද් ඉබ්නු සාබිත් (රළි)
(iii) ඉබ්නු අබ්බාස් (රළි) (iv) සුබෛයිර් (රළි)

(23) අල් කුර්ආනය එක්රැස් කර එකම අයුරින් පාරායනා කිරීමට සැලැස්වීම වෙනුවෙන් උස්මාන් (රළි) තුමාට ලැබුණු ගෞරවනීය නාමය
(i) ජාමිඋල් කුර්ආන් (ii) ජාමිඋල් හදීස්
(iii) ජවාමිඋල් කලීම් (iv) දුන්නූරෛයින්

(24) ඉන්ද්‍රිය ඥානයට සහ විචක්ෂණඥානයට වඩා ඉහළින් ඇති ඥානය ලෙස ඉස්ලාම් හඳුන්වනුයේ,
(i) අනුභාවික දැනුම (ii) අධ්‍යනයෙන් ලත් දැනුම
(iii) අත්දැකීමෙන් ලත් දැනුම (iv) වහී දැනුම

(25) එක් මුස්ලිම්වරයෙකු දිනපතා ෆර්ල් සලාතයෙන් පසු අල් කුර්ආනයේ වාක්‍යයක් පාරායනා කළ විට, ඊළඟ ෆර්ල් සලාතය දක්වා අල්ලාහ්ගේ ආරක්ෂාවෙහි සිටින බව නබි (සල්) තුමා පවසා ඇති කුර්ආන් වාක්‍යය
(i) ආයතුන් තීන් (ii) සූරා ඉක්රා හි පළමු වාක්‍ය
(iii) ආයතුල් කුර්සි (iv) සූරා යාසීන් හි අවසන් වැකිය

(26) මුහම්මද් නබි (සල්) තුමා සහ සහාභාවරුන්ගේ මඟ පිළිපැදූ අය හැඳින්වෙන නම
(i) මුෂසිලා (ii) අහ්ලුස්සුන්නාහ් වල් ජමාආ (iii) මුර්ජිආ (iv) ජබරියා

(27) සලාත් හි ඉෆ්තිරාෂ් යනුවෙන් හැඳින්වෙන අවස්ථාවේ දී රැඳී සිටින ඉරියව්ව හැඳින්වෙන නම
(i) අවසාන අත්තහියාත් හිඳුම (ii) මැද හිඳුමේ සිටින අවස්ථාව
(iii) මැද අත්තහියාත්හි හිඳුම (iv) සලාම් දුන් පසු හිඳුම

(28) ඔබ පස්වේල් සලාතයේ නොවරදවා ඉටු කරන මුස්ලිම්වරයෙකු වශයෙන්, පස්වේල සලාතය පිළිබඳ ඉස්ලාමීය නීතිය
(i) ෆර්ල් අයින් (ii) ෆර්ල් කිෆායා (iii) වාජිබ් (iv) සුන්නාමුඅක්කදා

(29) පහත සඳහන් A සහ B තීරු නිවැරදිව ගැලපූ විට ගැලපෙන පිළිතුර

A	B
(1) රබ්බුල් ආලමීන්	A. මිනිසුන්ගේ ස්වාමියා
(2) රබ්බුන් නාස්	B. මුළු මිනිස් සංහතියට අයත් නබි
(3) රහ්මතුන් ලිල් ආලමීන්	C. සර්ව දූතයා
(4) කාආෆතුන්ලින්නාස්	D. සර්ව බලධාරියා

(i) DBCA (ii) BCDA (iii) BDAC (iv) DACB

(30) විශ්වාසවන්ත සහ සත්‍යවාදී වෙළෙන්දා අවසන් දිනයේ කවුරුන් සමඟ සිටී ද යන්න නබි (සල්) තුමාණන් ප්‍රකාශ කර ඇත්තේ ද?
(i) නබිවරුන් සමඟ (ii) සිද්ක්කීන්වරුන් සමඟ
(iii) ෂුහාදාවරුන් සමඟ (iv) සියල්ල නිවැරදිය

(31) කලබලයෙන් සහ නොසන්සුන්බවින් තොර තැන්පත් නිර්මල සිත හැඳින්වනුයේ
(i) නෆ්සුල් ලව්වාම (ii) නෆ්සුල් මුත්මඉන්නා
(iii) නෆ්සුල් අ මිමාරා (iv) නෆ්සුල් බිස්සූ

(32) මුහම්මද් නබි (සල්) තුමා හදීසයක නියම වීරයෙකුගේ ගුණාංගයක් පිළිබඳ පවසා ඇත. එම ගුණාංගය වනුයේ,
(i) මල්ලවපොර තරඟයේ දී ප්‍රතිවාදියාව බිමට හෙලන්නා
(ii) ප්‍රතිවාදියා සමඟ තරඟ කර ජයග්‍රහණය කරන්නා
(iii) කෝප වූ අවස්ථාවක තමන් පාලනය කර ගන්නා
(iv) රෝගී ව උපවාසයේ යෙදෙන්නා
(v)

(33) "එක් පුද්ගලයකු තමන්ගේ අවශ්‍යතාවන් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා නොකරන අවස්ථාවේ දී" එම පුද්ගලයා වෙත අල්ලාහ්,
(i) කෝප වෙයි (ii) සතුටු වෙයි (iii) පුදුම වෙයි (iv) දුකට පත් වෙයි

(34) ඔබ සලාතයේ දී පළමු තක්බීරය බැඳගත් වහාම පාරායනය කළ යුත්තේ,
(i) සූරා ෆාතිහා (ii) දුආවුල් ඉස්තිෆ්තා
(iii) අල්හම්දුලිලාහ් (iv) කුමක් හෝ සූරාවක්

(35) අල්ලාහ් සමඟ කථාබස් කිරීමට අවස්ථාවකි සලාතය. ඔබ සලාතයේ දී සූරතුල් ෆාතිහා පාරායනා කරන විට අල්ලාහ් එයට පිළිතුරු දෙයි. අර්රහ්මාන් නිර්රහීම් යයි පැවසූ විට අල්ලාහ් දෙන පිළිතුර වනුයේ
(i) මාගේ ගැත්තා මාව පිළිගත්තා යනුවෙන් පිළිතුරු දෙයි.
(ii) මාගේ ගැත්තා මාව ප්‍රශංසා කළා යනුවෙන් පිළිතුරු දෙයි.
(iii) මෙය මාහා මාගේ ගැත්තා අතර ඇති ගණුදෙනුවක් යනුවෙන් පිළිතුරු දෙයි.
(iv) මාගේ ගැත්තා ඉල්ලුදෙය ගැත්තාට ලැබුණි යනුවෙන් පිළිතුරු දෙයි.

(36) පරලොව ජීවිතයේ දී කුමන අමලයක් පිළිබඳ මුලින්ම ප්‍රශ්න කරනු ලබන්නේ ද?
(i) උපවාසය (ii) zසකාත් (iii) සලාතය (iv) හජ්

(37) කුඹියා හා මී මැස්සා කුමන නජීස්වර්ගයට අයත්වේද?
(i) මෘදු නජීස් (ii) සාමාන්‍ය නජීස් (iii) දැඩි නජීස් (iv) නජීස් නොවේ

(38) කුල්ලතෛයින් ප්‍රමාණය යනුවෙන් හැඳින්වෙන ජල ප්‍රමාණය වනුයේ
(i) 210 *l* ට වඩා වැඩි ජලය (ii) 205 *l* ට වඩා වැඩි ජලය
(iii) 200 *l* ට වඩා වැඩි ජලය (iv) 110 *l* ට වඩා වැඩි ජලය

(39) ඉමාරත් යන පදයෙහි අර්ථය
(i) අල්ලාහ්ව නැමද යටත් වන වගකීම (ii) පොළොව සශ්‍රික කරන ක්‍රියාවලිය
(iii) අල්ලාහ්ගේ කලීෆා වශයෙන් කටයුතු කිරීම (iv) දෑවා සේවය

(40) කබ්ර් , බෑස් , මහ්ෂර් , හිසාබ් , මීzසාන් , හව්ල් , සිරාත් , ජන්නා , නාර් පරලොව ජීවිතය හා සම්න්ධ කරුණු පහත කුමන කොටසට ඇතුලත් වී තිබේ ද?
(i) අල් ඉලාහියාත් (ii) අන් නුබූව්වත්
(iii) අස් සම්ඊයාත් (iv) අර් රූහ්හානියාත්

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 10	විෂයය / பாடம் / Subject: ඉස්ලාම් - Islam	පත්‍රය / வினாத்தாள் / Paper: II	පැය / மணித்தியாலம் / Hours: 2

II – කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න 4 ක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, ඉතිරි ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද ලැබේ.**

(01) කෙටි පිළිතුරු සපයන්න.

(1) තයමුම් කිරීමට හැකි අවස්ථා 2 ක් ලියන්න.

(2) මුස්ලිම්වරයෙකුගේ යහගුණාංග පිළිබඳ කථා කරන සූරා 2 ක් නම් කරන්න.

(3) මා අත්හැර යන කරුණු 2 ක් ඔබ පිළිපැදින තුරු ඔබ වැරදි මාර්ගයේ නොයයි. යනුවෙන් නබි (සල්) තුමා පැවසූ කරුණු දෙක කවරේද?

(4) අල් කුර්ආනයේ තැන් කිහිපයක දී කිතාබ් සහ හික්මා යන වචනයන් සඳහන් වී ඇත. කිතාබ් සහ හික්මා යන වචන වල අර්ථයන් කවරේද?

(5) සුන්නාත්ව ආරක්ෂා කිරීම සඳහා සහභාවරු අනුගමනය කළ කරුණු 2 ක් ලියන්න.

(6) ආදම් (අලෛ) තුමාගේ පුතනුවන් දෙදෙනෙකු වන ආබිල් , කාබිල් කළ රැකියාව කවරේද?

(7) සේවා සපයන රැකියාවල කොටස් දෙක කවරේද?

(8) විවාහවීමෙන් මහර්රම්වන පුද්ගලයන් දෙදෙනෙකු නම් සඳහන් කරන්න.

(9) වසතියා යනු කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(10) ෆික්හුල් අව්ලවියාත් යනු කුමක් ද?

(02)

(1) තස්කියා යන අරාබි පදයේ අර්ථය සහ ඉස්ලාමීය භාෂා ව්‍යවහාරයේ අර්ථය ලියන්න.

(2) ඔබේ සිතේ පාරිශුද්ධතාවය ඇතිවීමට ඔබ කුමක් කළ යුතුද? කරුණු 3 ක් ලියන්න.

(3) ආයතුල් කුර්සියේ අල්ලාහ්ගේ ගුණාංග පවසා ඇත. ඉන් ගුණාංග 5 ක් ලියන්න.

(03)

(1) ඉස්ලාම් ආර්ථිකයේ මූලික සංකල්ප දෙක කවරේද?

(2) ඉස්ලාමීය ආර්ථිකය නැමදුමක් බවට පත්වීමට ඉස්ලාමයේ අනුගමනය කළ යුතු කරුණු 3 ක් ලියන්න.

(3) ඉස්ලාමීය ආර්ථිකය වැඳගත්වීමට හේතු වූ කරුණු 5 ක් ලියන්න.

(04)

(1) වඩු කර්මාන්තය හඳුන්වා දුන් නබිවරයා කවුද? යකඩ මෙලෙක් කරන තාක්ෂණය භාවිතා කර බිත්ති නිර්මාණය කළ රජතුමා කවුද?

(2) වෙළඳාම සඳහා අනුමත කළ කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න.

(3) ඉස්ලාම් පවසා ඇති මානව අයිතිවාසිකම් 5 ක් ලියා කෙටියෙන් පැහැදිලි කරන්න.